// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2477/33 - 2026 පෙබරවාරි මස 25 වැනි බදාදා - 2026.02.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ**
**බිංගිරිය ප්‍රාදේශීය සභාවේ**
**සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන බිංගිරිය ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ බිංගිරිය ප්‍රාදේශීය සභාව සඳහා තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත්වූ ලක්මල් වික්‍රමආරච්චි අයත් වන්නා වූ සර්වජන බලය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම බිංගිරිය ප්‍රාදේශීය සභාව සඳහා තෝරා එවිය යුතු සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා රන්දෙනිගල දිසාවගේ රිචඩ් අබේවර්ධන නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

බිංගිරිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි රත්නායක මුදියන්සේලාගේ හරේන්ද්‍ර බණ්ඩාර රත්නායක වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 66අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් රන්දෙනිගල දිසාවගේ රිචඩ් අබේවර්ධන, බිංගිරිය ප්‍රාදේශීය සභාවට තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**ආර්. එම්. එච්. බී. රත්නායක,**
තේරීම්භාර නිලධාරි,
බිංගිරිය ප්‍රාදේශීය සභාව.

2026 පෙබරවාරි මස 25 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කුරුණෑගල.

EOG 02 - 0208

1A - PG 7548 — 08 (2026/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*